# ප්‍රසම්පාදන දැන්වීම

## ශ්‍රී ලංකා නාවික හමුදාව

### 2025 වර්ෂයේ ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් මස 31 දක්වා ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත වෛද්‍ය විෂයයන් සැපයීම සඳහා නිෂ්පාදකයන්ගෙන්/ආනයන කරුවන්ගෙන්/සැපයුම්කරුවන්ගෙන්/කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඒකක කොන්ත්‍රාත් මිල ගණන් යටතේ මිල ගණන් කැඳවීම.

1. ශ්‍රී ලංකා නාවික හමුදාවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත **2025 ජනවාරි මස 01 වන දින සිට 2025 දෙසැම්බර් මස 31 වන දින දක්වා** පහත සඳහන් විෂය කාණ්ඩයන් යටතේ වෙන් වෙන් මිල ගණන් කැඳවීම් වලට අයත් වෛද්‍ය විෂයයන් එක් මිල කැඳවුමක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඒකක කොන්ත්‍රාත් මිල ගණන් යටතේ සැපයිය හැකි නිෂ්පාදකයන්, ආනයනකරුවන්, සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත් කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ. ඉදිරිපත් කරන මිල ගණන් වල වලංගු කාලය **2025 ජනවාරි මස 01 වන දින සිට 2025 දෙසැම්බර් මස 31 වන දින දක්වා** විය යුතුයි.

අ. තෝරා ගන්නා කොන්ත්‍රාත්කරුවන් නාවික හමුදාව විසින් ඇණවුම් කරනු ලබන වෛද්‍ය විෂයයන් මාණ්ඩලික නිළධාරී(මධ්‍යම ඖෂධ ගබඩාව) නාවික හමුදා මුලස්ථානය, තැ.පෙ 593, කොළඹ 01. වෙත සැපයුම් කල යුතුය.

ආ. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් එක් එක් කාණ්ඩයන් සඳහා ආපසු නොගෙවනු ලබන **රු. 5,000.00** ක අයදුම්පත් ගාස්තුව මුදලින්, අධ්‍යක්ෂ (මුදල්) ශ්‍රී ලංකා නාවික හමුදා මුලස්ථානය, තැ.පෙ 593, කොළඹ 01 වෙත ඉදිරිපත් කර අයදුම්පත් **2024 සැප්තැම්බර් මස 03 වන දින සිට 2024 සැප්තැම්බර් මස 22 වන දින දක්වා** සතියේ වැඩකරන දින වල **1000 පැයේ සිට 1400 පැය දක්වා** නාවික හමුදා මුලස්ථානය, කොළඹ 01 හිදී ලබා ගත හැකි අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත දක්වා ඇති පරිදි ඉදිරිපත් කල යුතුය.

2. 2025 වර්ෂය සඳහා අවශ්‍ය වෛද්‍ය විෂයයන් වල විස්තර සහ අවශ්‍යතා ප්‍රමාණයන් එක් එක් මිල ගණන් කැඳවුම් අනුව අයදුම්පත් සමඟ නිකුත් කරනු ලැබේ.

විෂයය කාණ්ඩයන් සහ අංකයන්

| මිල ගණන් කැඳවුම් කාණ්ඩ අංකයන් | විෂයය කාණ්ඩ විස්තරය | මිල ගණන් කැඳවීම අවසන් වන දිනය හා විවෘත කරන වේලාව |
|---|---|---|
| එස්එල්එන්/සීඑම්එස්/01/ආර්සී/2025 | ආසාධන තත්ව සඳහා ඖෂධ | 2024 සැප්තැම්බර් 23 , 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/02/ආර්සී/2025 | හෘද රෝගී තත්ව සඳහා ඖෂධ - 1 | 2024 සැප්තැම්බර් 23 , 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/03/ආර්සී/2025 | හෘද රෝගී තත්ව සඳහා ඖෂධ - 2 | 2024 සැප්තැම්බර් 23 , 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/04/ආර්සී/2025 | ස්නායු රෝගී තත්ව සඳහා ඖෂධ | 2024 සැප්තැම්බර් 23 , 1000 පැය |

| | | |
|---|---|---|
| එස්එල්එන්/සීඑම්එස්/05/ආර්සී/2025 | පෝෂණ සහ රුධිර වර්ධක සඳහා ඖෂධ | 2024 සැප්තැම්බර් 23 , 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/06/ආර්සී/2025 | ස්වසන රෝගී තත්ව සඳහා ඖෂධ | 2024 සැප්තැම්බර් 23 , 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/07/ආර්සී/2025 | ආමාශයික රෝගී තත්ව සඳහා ඖෂධ | 2024 සැප්තැම්බර් 23 , 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/08/ආර්සී/2025 | උගුර ඇස කණ සහ නාසය ආශ්‍රිත රෝගී තත්ව සඳහා ඖෂධ | 2024 සැප්තැම්බර් 23 , 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/09/ආර්සී/2025 | චර්ම රෝගී තත්ව සඳහා ඖෂධ | 2024 සැප්තැම්බර් 23 , 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/10/ආර්සී/2025 | අන්තරාසර්ග රෝගී තත්ව සඳහා ඖෂධ | 2024 සැප්තැම්බර් 23 , 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/11/ආර්සී/2025 | අස්ථි සහ සන්ධි රෝගී තත්ව සඳහා ඖෂධ | 2024 සැප්තැම්බර් 24, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/12/ආර්සී/2025 | අර්ධ ස්වයංක්‍රීය ජෛව රසායන විශ්ලේශකය සඳහා උත්තේජකයන්. | 2024 සැප්තැම්බර් 24, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/13/ආර්සී/2025 | වෛද්‍ය පරීක්ෂණ නල | 2024 සැප්තැම්බර් 24, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/14/ආර්සී/2025 | වෛද්‍ය පරීක්ෂණ සඳහා විවිධ අයිතම | 2024 සැප්තැම්බර් 24, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/15/ආර්සී/2025 | වෛද්‍ය පරීක්ෂණ පටි(පරීක්ෂණ තීරු) | 2024 සැප්තැම්බර් 24, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/16/ආර්සී/2025 | නික්ෂේපන උපකරණ සහ කටු | 2024 සැප්තැම්බර් 24, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/17/ආර්සී/2025 | සැරහුම් සඳහා යොදා ගන්නා අයිතම | 2024 සැප්තැම්බර් 24, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/18/ආර්සී/2025 | දියර අදින බට සහ නික්ෂේපන කටු | 2024 සැප්තැම්බර් 24, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/19/ආර්සී/2025 | පිටතින් පැළඳවීම සඳහා යොදාගන්නා ශල්‍ය උපකරණ | 2024 සැප්තැම්බර් 24, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/20/ආර්සී/2025 | වෙනත් පාරිභෝජනීය ශල්‍ය අයිතම | 2024 සැප්තැම්බර් 24, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/21/ආර්සී/2025 | මැසීම සඳහා යොදාගන්නා ශල්‍ය අයිතම | 2024 සැප්තැම්බර් 24, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/22/ආර්සී/2025 | මහජන සෞඛ්‍ය හා සම්බන්ධ පළිබෝධ/රසායනික අයිතම | 2024 සැප්තැම්බර් 24, 1000 පැය |

3. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය (මිල ගණන් ඇගයීමේදී මෙම කරුණු සැලකිල්ලට ගනු ලැබේ)

- අ. වෛද්‍ය විෂයයන් සමාන ධාරිතා බලයක් සහිතව රජයේ / පෞද්ගලික ආයතන වෙත සැපයීම පිළිබඳව වර්ෂ 02ක සතුටුදායක කාර්ය සාධනයක් තිබෙන බවට වාර්ථා.
- ආ. විලවුන් උපකරණ සහ ඖෂධ සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරිය මගින් දෙනු ලබන සහතිකය.(වලංගු සහතිකයක් විය යුතුය)
- ඇ. ස්ථිර මූල්‍යමය හැකියාව.
- ඈ. ලංසු සුරක්ෂණ (ලබා දෙන ලංසු සුරක්ෂණ අවමය මාස 06ක කාල සීමාවක් විය යුතුය)
- ඉ. බදු ගෙවීම පිළිබඳ සතුටුදායක වාර්ථා.
- ඊ. ප්‍රමාණවත් පරිදි පණිවිඩ හුවමාරු පහසුකම් තිබීම. (දුරකථන, ජංගම දුරකථන, ෆැක්ස් යන්ත්‍ර, විද්‍යුත් ලිපින)
- උ. ප්‍රමාණවත් පරිදි ගබඩා පහසුකම් තිබීම.

ඉ. ප්‍රමාණවත් පරිදි කාර්ය මණ්ඩලයක් සිටීම සහ කාර්යාල පහසුකම් තිබීම.

එ. ප්‍රමාණවත් පරිදි ප්‍රවාහන පහසුකම් තිබීම.

ඒ. ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කිරීමේ සහතිකයේ හෝ සංස්ථාපිත සහතිකයේ පිටපතක් ඉදිරිපත් කල යුතුය. එසේ ලියාපදිංචි වීමෙන් පසු ආසන්න වසර 03ක කාලය තුල අඛණ්ඩව ව්‍යාපාර කටයුතු වල යෙදී සිටි බවට වාර්ථා ඉදිරිපත් කල යුතුය.

4. අයදුම්කරුවන් තම මිල ගණන් ඉදිරිපත් කිරිමේදී වැට් බදු සඳහා ලියාපදිංචි අංකය සඳහන් කර තිබීම අනිවාර්ය වේ. වැට් බදු සඳහා ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල් වෙතින් ලබාගත් වැට් බදු ලියාපදිංචියෙන් නිදහස් බවට සනාථ කරන සහතිකයක් අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතුය. තවද, ඉහත අවශ්‍යතාවයන් සපුරා නොමැති මිල ගණන් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. අයදුම්කරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ලිපි කවරයේ වම් පස ඉහල කෙළවරේ “ශ්‍රී ලංකා නාවික හමුදාවට 2025 වර්ෂය සඳහා වෛද්‍ය විෂයයන් සැපයීම සඳහා කොන්ත්‍රාත් මිළ ගණන් ඉදිරිපත් කිරිම” (විෂයය කාණ්ඩය) එස්එල්එන්/ සීඑම්එස් /......./ආර්සී/2025 ටෙන්ඩර් පත් විවෘත කරන දිනය, වේලාව සඳහන් කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ පහත ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් බහාළුම් පෙට්ටියේ තැම්පත් කිරීමට කටයුතු කල යුතුය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා නාවික හමුදාව,
නාවික හමුදා මුලස්ථානය,
තැ.පෙ 593,
කොළඹ 01.

6. මිල ගණන් භාරගන්නා අවසාන දිනය හා වේලාව පසුවූ වහාම ලද අයදුම්පත් විවෘත කරනු ලැබේ. සැපයුම් කරුවන් හට අයදුම්පත් විවෘත කරනු ලබන ස්ථානයට පැමිණිය හැකිය. තවද ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, විවෘත කිරීමකින් තොරව ආපසු භාරදෙනු ලැබේ.

7. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද මිල ගණන් පත්‍රිකා හා ලිඛිත සාක්ෂි අවශ්‍ය පරිදි ඉදිරිපත් නොකරන ලද, නිසි පරිදි සහතික නොකරන ලද ටෙන්ඩර් පත්‍රිකාද ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනැම මිල ගණන් පතක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරිමේ බලය සභාපති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

8. තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෙත ගිවිසුම් අත්සන් කිරීම සඳහා ලියාපදිංචි තැපැලෙන් දැනුම් දෙනු ලැබේ.

9. ටෙන්ඩර් අයදුම්පත් කිසිදු ගෙවීමකින් තොරව මාණ්ඩලික නිළධාරී (වෛද්‍ය සැපයුම්), නාවික හමුදා මුලස්ථානය, කොළඹ 01 යන ස්ථානයේ පරීක්ෂා කර බැලිය හැක.

10. වැඩි විස්තර සඳහා මාණ්ඩලික නිලධාරී (වෛද්‍ය සැපයුම්) දු.ක. 011 7195541, අධ්‍යක්ෂ නාවික සැපයුම් හා සේවා දු.ක 011 2212321 සහ අධ්‍යක්ෂ ජෙනරාල් සැපයුම් හා සේවා, දු.ක 0112334995 නාවික හමුදා මුලස්ථානය, කොළඹ 01 වෙතින් ලබා ගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
ශ්‍රී ලංකා නාවික හමුදාව
කොළඹ 01